උපලේඛනය II

## ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් තනතුරුවලට පත්කිරීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා වන ලකුණු ලබා දීමේ පරිපාටිය - 2024

**01. ජ්‍යෙෂ්ඨතාවය :** උපරිම ලකුණු 50

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I ශ්‍රේණියේ සේවා කාලය සඳහා 1 ශ්‍රේණියට උසස්වූ දින සිට ලකුණු ලබාදීම සිදු කරන අතර ලබා දෙනු ලබන ලකුණු ප්‍රමාණය රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍ර ලේඛ අංක 01/2019 අනුව තිරණය කරනු ලැබේ. එනම් වැඩිම සේවා කාලයක් සහිත නිලධාරියාට සේවා පළපුරුද්ද සඳහා වෙන් කර ඇති මුළු ලකුණු ප්‍රමාණයද සෙසු නිලධාරීන්ට සමානුපාතික ලෙස I ශ්‍රේණියේ සේවා කාලය සඳහා ලකුණු ලබාදීමද සිදු කරනු ලැබේ.

**02. අතිරේක අධ්‍යාපන සුදුසුකම් :** උපරිම ලකුණු 12

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ බඳවා ගැනීමේදී, ශ්‍රේණි උසස්වීම් හෝ මෙම සම්මුඛ පරීක්ෂණයේ මූලික සුදුසුකමක් ලෙස සලකා බලනු ලබන ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේදී වන කාර්යක්ෂමතා කඩඉම සඳහා අදාළ වන අධ්‍යාපන සුදුසුකම හැර පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් අතුරින් ඉහළම අතිරේක අධ්‍යාපන සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| I. | දර්ශනශූරි (PhD) | - ලකුණු 12 |
| II. | දර්ශනපති (M Phil) | - ලකුණු 10 |
| III. | පශ්චාත් උපාධිය (MA, MSc, MBA, MEd, MATE.....) | - ලකුණු 08 |
| IV. | පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | - ලකුණු 06 |

මෙහිදී ඉදිරිපත් කරන සහතික විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ලබා තිබිය යුතුය.
තව ද, අයදුම්කරුවන් විසින් ඒ බව අදාළ ලේඛනවල සනාථ කර සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී පමණක් ඉදිරිපත් කළ යුතුය. පසුව ඉදිරිපත් කරනු ලබන ලේඛන පිළිගනු නොලැබේ.

**03. සන්ධාන භාෂා ප්‍රවීණතාවය:** උපරිම ලකුණු 06

අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව ලබා දෙනු ලබන මාතෘකා කිහිපයක් අතුරින් අහඹු ලෙස තෝරා ගනු ලබන මාතෘකාවක් යටතේ මිනිත්තු 03 ක කාලයක ඉදිරිපත් කිරීමක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් කළ යුතු අතර ඒ සඳහා පහත නිර්ණායක යටතේ ලකුණු ලබා දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| I. | විෂයය අන්තර්ගතය | - ලකුණු 2 |
| II. | ඉදිරිපත් කරන විලාසය | - ලකුණු 2 |
| III. | භාෂාව හැසිරවීම | - ලකුණු 2 |

**04. තොරතුරු සන්නිවේදන හැකියාව :** උපරිම ලකුණු 02

මාස 6 ක් හෝ පැය 720 ක් හෝ ඊට වැඩි තොරතුරු සන්නිවේදන තාක්ෂණය/ තොරතුරු තාක්ෂණය පිළිබඳ හදාරන ලද පාඨමාලාවක් සඳහා

තවද, මෙහිදී ඉදිරිපත් කරන සහතික පත්‍රවලට ලකුණු ලබා දෙනුයේ සහතික පත්‍රයේ හෝ විස්තරාත්මක ලකුණු ලේඛනයේ (Transcript වල) අදාළ පාඨමාලාවේ කාලය සඳහන් වන්නේ නම් පමණි.

**05. විෂයය බාහිර ක්‍රියාකාරකම් හා ජයග්‍රහණ :** උපරිම ලකුණු 10

I. ක්‍රීඩා/නාට්‍ය/කලා උළෙල හෝ බාලදක්ෂ/ශිෂ්‍යභට/ එඩින්බරෝ ආදී අවස්ථාවන්හි දී ගුරු ශික්ෂණලාභීන් / ගුරු සිසුන් මෙහෙයවා ලබා ගත් සාර්ථකත්වයන් සඳහා ලද ඇගයීම් /ප්‍රශංසා සහතික හෝ ගුරු අධ්‍යාපන ක්ෂේත්‍රයේ උන්නතිය ගෙනවනුවෙන් කරන ලද නව නිර්මාණ / සුවිශේෂී දායකත්වයන් වෙනුවෙන් ලබා ගත් සහතික.

[අධ්‍යාපන ලේකම්/ප්‍රධාන කොමසාරිස් විසින් නිකුත් කර ඇති හෝ යම් පනතකින් ස්ථාපිත කර ඇති ආයතනයකින් හෝ රජයේ අනුබද්ධිත ආයතනයකින් හෝ රජයේ පිළිගත් ජාත්‍යන්තර ආයතනයක ප්‍රධානියකු විසින් නිකුත් කරන ලද සහතික සඳහා (මෙහිදී තහවුරු කළ හැකි ලේඛන ඉදිරිපත් කළ යුතු අතර සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ යම් අවිනිශ්චිතතාවයක් මතු වුව හොත් අදාළ ආයතන වලින් විමසා එම ලබා දෙන ලකුණු පිළිබඳ අවසාන තීරණයකට එළඹෙනු ඇත.)]

එක් සහතිකයකට ලකුණු 02 බැගින් උපරිම සහතික 04 ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

-ලකුණු 08

II. අධ්‍යාපන ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පොදු 230 බී ප්‍රශංසා හා දෝෂ දර්ශන ආකෘතිය අනුව විධිමත් පරිදි නිකුත් කරන ලද සේවා ඇගයීම් - ලකුණු 02

(දෙපාර්තමේන්තු ප්‍රධානියා යනු ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) වේ.)

එකකට ලකුණු 1 බැගින් උපරිම සේවා ඇගයීම් 2 ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

**(ඉහත 05.I හි සඳහන් කාර්යයක් සඳහා කරනු ලබන සේවා ඇගයීම් මේ යටතේ සලකා බලනු නොලැබේ.)**

06. පර්යේෂණ හා ප්‍රකාශන : උපරිම ලකුණු 15

අ) . පර්යේෂණ - ලකුණු 05

පශ්චාත් උපාධියට/ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනයට අදාළ වූ පර්යේෂණ / නිබන්ධන සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර ප්‍රසිද්ධ පර්යේෂණ සාකච්ඡා මණ්ඩපයකට (Research Symposium) ඉදිරිපත් කරන ලද හෝ පර්යේෂණ සඟරාවක (Research Journal) පළ කරන ලද පර්යේෂණ වාර්තා 01ක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

I. තනිපුද්ගල පර්යේෂණ වාර්තා - ලකුණු 05

II. කණ්ඩායම් පර්යේෂණ වාර්තා - ලකුණු 03

(ප්‍රසිද්ධ සාකච්ඡා මණ්ඩපයක් යනු පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ විද්වතෙකු හා පර්යේෂණ සිදු කරන ලද ක්ෂේත්‍රයට අදාළ විද්වතෙකු සහ අවම මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකුගෙන්වත් සමන්විත මණ්ඩපයක් ලෙස මෙහිදී සලකනු ලැබේ.)

ආ) . ප්‍රකාශන - ලකුණු 10

I. විෂයානුබද්ධව නිකුත් කරන ලද ජාත්‍යන්තර ප්‍රමිත පොත් අංකයක් (ISBN) හෝ ජාත්‍යන්තර වාර සඟරා අංකයක් (ISSN) ලද ප්‍රකාශනයක් සඳහා.(තනි පුද්ගල කතෘ හිමිකාරීත්වයක් දරණ පොත් හා සඟරා සඳහා පමණක් ලකුණු ලබා දීමේ දී සළකා බලනු ලැබේ.)

එකකට ලකුණු 04 බැගින් උපරිම 01ක් සඳහා

II. විෂයානුබද්ධව නිකුත් කරන ලද ජාත්‍යන්තර ප්‍රමිත පොත් අංකයක් (ISBN) ලද ප්‍රකාශනයක පරිච්ඡේදයක් හෝ කතෘ හිමිකාරීත්වය සහිත ප්‍රකාශයට පත් කරන ලද තීරක සඟරා (Refereed Journals) (පරිච්ඡේදය හෝ තීරක සඟරාව සඳහා තනි පුද්ගල කතෘ හිමිකාරීත්වයක් තිබිය යුතුය.)

එකකට ලකුණු 02 බැගින් උපරිම 02ක් සඳහා

III. කතෘ හිමිකාරිත්වය සහිත ප්‍රකාශයට පත් කරන ලද සාරාංශ (Abstracts) හෝ පුවත්පත් හෝ සඟරාවල ප්‍රකාශයට පත් කරන ලද විෂයානුබද්ධ ලිපි.

එකකට ලකුණු 01 බැගින් උපරිම 02 ක් සඳහා

07. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන සමස්ථ කුසලතාවය : උපරිම ලකුණු 05

මුළු ලකුණු 100